ආනන්ද විද්‍යාලයීය ආදී ගුරු සංගමය

# ANANDA COLLEGE PAST TEACHERS ASSOCIATION

ආනන්දයේ සම්ප්‍රදායන් සුරකින . ආනන්ද ආදී පුතුන් වෙත කෙරෙන කාරුණික කාරුණික දැණුම් දීමයි;

හිතවත් අනද පුතුනි,

වසර. 1950 සිට ආනන්දීය ආනන්දයේ ඉගැන්වීමේ යෙදුනු ගුරු පියවරුන් හා මව්වරුන් ඒකරාශී වී 1991 වසරේදී 45 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් විසින් දිවයිනේ ප්‍රථම වරට ආදී ගුරු සංගමයක් ආරම්භ කරන ලදී. 21 වසරක දිගු කාලයක් තුලදී සමාජිකත්ව 350කට ආසන්න වී ඇත. එදා මේදා තුල සෑම වසරක් අවසානයේදීම මහාසභා රැස්වීමක් පැවැත්වීම නොකඩවා සිදු කරනු ලැබිනි. 2013 දෙසැම්බර් 15 වන දින මෙලෙස පවත්වනු ලබන්නේ 22 වන සංවත්සර මහා සභාවයි.

පසුගිය වසර කීපයේදීම එදින සහභාගීත්වය ගුරුභවතුන් 125කට අධිකය. එය අග නගරයේ ඇති ප්‍රධාන උත්සව ශාලාවක පැවැත්වීම සිදුකරනු ලැබේ. මෙවරද එය දෙසැම්බර් 15 වන ඉරුදින පැවැත්වීමට සැලසුම් කර ඇත. මේ සඳහා සාමාජිකත්වයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලකි. එහෙත් එසේ ගෙවු ලබන මුදල වෙනුවෙන්ද ගුරුභවතුන් අතරේ ලොතරැයියක් පැවැත් වීමෙන් ජයග්‍රාහකයන් වෙත වටිනා ත්‍යාග රාශියක් ද පිරිනැමීම කරනු ලැබේ. මෙයට අමතරව සහභාගීවන සෑම සාමාජිකයෙකුටම ශාලාවට ඇතුළු වීමේදී වටිනා සිහිවටන කිහිපයක්ද නොමිලයේ පිරිනැමීම සිදුකෙරේ. අප සංගමය ආර්ථික වශයෙන් එතරම් පොහොසත් නොවන හෙයින් දිවයිනේ දියුණු ව්‍යාපරයන් හොබවන ආදි ආනන්දීයන්ගෙන් සහය මේ සඳහා ලැබී ඇත.

ප්‍රථම වතාවට අප සැමගේ යෝජනාව වුයේ එතෙර සිටින ආනන්ද ආදී පුතුනටද මේ ගැන සිහිකැඳවීමක් කොට එහි බර පැන පියවාගැනීම සඳහා දන්වන්නේ නම් මැනව යන්නය. එබැවින් මෙවර සංවත්සරය උත්කර්ෂවත් අයුරින් පැවත්වීමට ආනන්දයෙන් සිප්සතර හදාරා, එතෙර වසන ඔබ පුතුන්ගෙන් ඉල්ලීමක් කරනු ලබන්නේ නම් යහපත් ප්‍රතිචාරයක් ලැබෙය යන්න බලාපොරොත්තු වෙනි.

ඔබ ඇතුළු පවුලේ සැමට ඉදිරි අනාගතය සාර්ථක වී ආනන්ද ධජය ලේලදවීමට ශක්තිය,ධෛර්ය,වාසනාව ලැබේවායි යන්න අපගේ පැතුමයි.

"ඔබ සැමට බුදු සරණයි"

ස්තුතියි,

මෙයට විශ්වාසි,

.............................

නෙල්සන් විජේසේන

(ගරු ලේකම් )


President
Lionel Gunasekara,
15/1, Gomes Path,
Colombo – 5
Tel: 2585402/0714399620

Secretary
Nelson Wijesena
280 High Level Road,
Maharagama.
Tel: 2850282/071 4402652

Treasurer
S.G. Dharmasena
6-G 1st Lane, Panagoda Road,
Nugegoda.
Tel: 5864614/ 0718248284